Sri Lanka's Largest Past Paper Bank - iskolee.com
ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසෙන්න. http://iscolee.blogspot.com/



# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

**ගණිතය** **කාලය පැය දෙකයි.**


**නම / අංකය : ........................................................** **8 ශ්‍රේණිය**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. $2.05 + 1.3 + 0.082$ සුළු කරන්න.


2. $135^0$ හි පරිපූරකය ලියන්න.

3. පහත සංඛ්‍යා රේඛාව ඇසුරෙන් හිස්තැන් පුරවන්න.




............ + (-3) = ...............


4. 1, 3, 5, 7, 9, ... යන සංඛ්‍යා රටාවේ පොදු පදය ලියන්න.

5. 


මෙහි AB යනු සරල රේඛාවකි. $x^{\circ}$ හි අගය සොයන්න.


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



6. 

රූපයේ දැක්වෙන ඝන වස්තුවේ නම කුමක් ද?

7. $2x(3y + 3) + 5x$ සුළු කරන්න.

8. 


රූපයේ පරිමිතිය සොයන්න.

9.

| භාණ්ඩය | 1kg ක මිල රු. |
|---|---|
| සහල් | a |
| සීනි | b |
| පරිප්පු | c |

මෙම මිල දර්ශනයට අනුව සහල් 5kg ක්, පරිප්පු 2kg ක් හා සීනි 1kg මිල දී ගත් අයෙකුට වැයවන මුදල සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න.

10. 12,18 යන සංඛ්‍යාවල ම.පො.සා. සොයන්න.

11. $(+5) - (-2)$ සුළු කරන්න.


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com




12. 2 x 2 x 2 x p x p x p x q x q x q බලවල ගුණිතයක් ලෙස ලියන්න.

13. $4 + 2x$ සාධකවලට වෙන් කරන්න.

14. රු. 5600 ක් නාමල් හා විමල් අතර 3:4 අනුපාතයට බෙදූ විට, නාමල්ට ලැබෙන මුදල කීය ද?

15. 

රූපයේ අඳුරු කර ඇති කොටස භාගයක් ලෙස ලියන්න.

16. 



ත්‍රිකෝණයේ අනුපූරක කෝණ යුගලක් නම් කරන්න.

17. තෑගි පාර්සලයක බර 2kg 350g නම් එවැනි තෑගි පාර්සල් 3 ක බර කිලෝග්‍රෑම්වලින් ලියන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



18. සරල දාර පමණක් ඇති ඝන වස්තුවක මුහුණත් 9 ක් ද ශීර්ෂ 9 ක් ද ඇත. එම ඝන වස්තුවේ දාර ගණන කීය ද?

19. 


අඳුරු කරන ලද කොටසේ වර්ගඵලය සොයන්න.

20. සමචතුරස්‍ර සංඛ්‍යා දෙකක එකතුව සමචතුරස්‍ර සංඛ්‍යාවක් වන අවස්ථාවකට උදාහරණයක් දෙන්න.


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## II කොටස

- **ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු ලියන්න.**

1. ‘




එක්තරා විද්‍යාලයක 8 ශ්‍රේණියේ සිසුන් විසින් ගණිත දිනය වෙනුවෙන් තනන ලද තොරණක දළ සටහනක් ඉහත දැක්වේ.

i. ත්‍රිකෝණාකාර කොටස් 2 හි පරිමිතිය සොයන්න (ල. 02)

ii. රූප සටහනේ දැක්වෙන තල රූප දෙකක් එක් වීමෙන් සෑදෙන තල රූපයක නම ලියන්න. (ල. 02)

iii. "ගණිත දිනය" යනුවෙන් සඳහන් සෘජුකෝණාස්‍ර කොටස වටේ පීත්ත පටියක් ඇල්ලීමට අදහස් කරයි. අවශ්‍ය පීත්ත පටියේ දිග කොපමණ ද? (ල. 02)

iv. ඉහත iii. හි සෘජුකෝණාස්‍ර කොටස හැර ඉතිරි කොටස වර්ණවත් රෙදිවලින් සැරසීමට තීරණය කර ඇත. ඒ සඳහා අවශ්‍ය වර්ණවත් රෙදිවල වර්ගඵලය සොයන්න. (ල. 02)

v. වර්ණ රෙදි $1m^2$ ක් රු. 220 ක් වේ නම්, රෙදි සඳහා යන මුළු වියදම සොයන්න. (ල. 02)

2. එක්තරා ඝන වස්තුවක් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ශීර්ෂ ගණන | මුහුණත් ගණන | දාර ගණන |
|---|---|---|
| 20 | 12 | 30 |

i. මෙම ඝන වස්තුවේ නම කුමක් ද? (ල. 01)


ii. ඉහත ඝන වස්තුව ඔයිලර් නියමයට අනුකූල වන බව පෙන්වන්න. (ල. 02)

iii. ඉහත ඝන වස්තුවේ මුහුණතක හැඩය කුමක් ද? (ල. 02)

iv. ප්ලේටෝ කැටයක ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

v. ප්ලේටෝ කැට නම් කරන්න. (ල. 03)

vi.



මෙම පතරොම භාවිතයෙන් සාදා ගත හැකි ඝන වස්තුව කුමක් ද? (ල. 02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



3. i. 12 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න. (ල. 02)

ii. සාධකවලට වෙන් කරන්න.

a) (ab + 2a) (ල. 02)


b) ( $x$ + $x$y) (ල. 02)

c) (-12 $x$ + 3y) (ල. 02)

iii. 72 පාදය ප්‍රථමක සංඛ්‍යා වූ බලවල ගුණිතයක් ලෙස ලියන්න. (ල. 02)

iv. p = 2, q=3 නම්, $3p^3q^2$ හි අගය සොයන්න. (ල. 02)

4.




i. හිස්තැන් පුරවන්න.

a) $A\hat{O}C$ හි ප්‍රතිමුඛ කෝණය .................. වේ. (ල. 01)

b) $A\hat{O}C$ හා $A\hat{O}E$............................. කෝණ යුගලකි. (ල. 02)

ii. $x$ හි අගය සොයන්න. (ල. 02)

iii. මෙම රූප සටහනේ ඇති පරිපූරක කෝණ යුගලක් නම් කරන්න. (ල. 02)

iv. $C\hat{O}B$ හි අගය ලබා ගන්න. (ල. 02)

v. $E\hat{O}C$ හා $A\hat{O}C$ බද්ධ කෝණ යුගලක් යැයි සඳුන් පවසයි. ඔබ එයට එකඟ වේ ද? නො වේ ද? හේතුව ලියා දක්වන්න. (ල. 03)

5. i. චොකලට් පෙට්ටියක ඇති චොකලට්වල ස්කන්ධය ග්‍රෑම් d ද, පෙට්ටියේ පමණක් ස්කන්ධය ග්‍රෑම් e ද වේ. එවැනි පෙට්ටි 15 ක ඇති චොකලට්වල මුළු ස්කන්ධය සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න. (ල. 02)

ii. සුළු කරන්න.

a) 2(3b - 1) (ල. 02)

b) 2p(4p - 2q) (ල. 02)

iii. 3(2b - c) - 2(2b + 2c) සුළු කරන්න (ල. 03)

iv. $x$ = 3 හා y = (-1) නම් 2$x$ - 3y + 3 හි අගය සොයන්න. (ල. 03)

6.

i. 1, 3, 6, 10, □, □ හිස් කොටුවලට ගැළපෙන සංඛ්‍යා මොනවා ද? (ල. 02)

ii. මෙම සංඛ්‍යා රටාව හඳුන්වන නම කුමක් ද? (ල. 02)

iii. ඉහත සංඛ්‍යා රටාවේ පස්වන පදයට අදාළ තිත් රටාව අඳින්න. (ල. 02)

iv. පොදු පදය $n^2$ වූ සංඛ්‍යා රටාවේ මුල් පද 05 ලියන්න. (ල. 02)

v. එම රටාව හඳුන්වන නම ලියන්න. (ල. 02)

vi. ඉහත සංඛ්‍යා රටා දෙකටම පොදු වූ සංඛ්‍යාවක් ලියන්න. (ල. 02)